# 10 ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර



10.1 රූපය - ජේසුස් වහන්සේ ප්‍රසාද ස්නාපනය ලැබූ අවස්ථාව

ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ වන්නේත් දූත මෙහෙවර ආරම්භ වන්නේත් උන්වහන්සේගේ ප්‍රසාද ස්නාපනයෙනි. එම අවස්ථාවේ දී ශුද්ධ ත්‍රිත්වය ම අනාවරණය විය. ජේසුස් වහන්සේගේ දේව පුත්‍රභාවයට ප්‍රකාශ විය. එය ශුද්ධ වූ ලූක් තුමා මෙසේ වාර්තා කරයි:

> මුළු සෙනඟ බෞතිස්ම ස්නාපනය ලැබූ විට, ජේසුස් වහන්සේත් බෞතීස්ම ස්නාපනය ලබා යාච්ඤා කරමින් සිටිය දී ස්වර්ගය විවර වී, ශුද්ධාත්මයාණෝ පරවියකුගේ රූපාකාරයෙන් උන් වහන්සේ කෙරෙහි පහළ වූ සේක. එවිට, "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය; ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි"යි අහසින් හඬක් නික්මිණි.
>
> (ලූක් 3:21-22)

ජෝර්දන් නදියේ දී සිදු වූ එම විශේෂ අත්දැකීමෙන් පසු ව ජේසුස් වහන්සේ දෙවි පියාණන් වහන්සේ සමග ගැඹුරු සංවාදයකට ඇතුළු වීම සඳහා පාළුකරයට ගිය සේක: උන්වහන්සේගේ අරමුණ වූයේ එම සංවාදය තුළින් තමන්වහන්සේගේ දූතික සේවා සඳහා ගැඹුරු සූදනමකට පිවිසීමට ය.

> ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන් පූර්ණ ව ජොර්දනෙන් ආපසු ආ විට ආත්මයාණන් වහන්සේ විසින් උන් වහන්සේ පාළුකරයට ගෙන යනු ලැබූ සේක. එහි දී දින සතළිහක් මුළුල්ලේ යක්ෂයා උන් වහන්සේ පරීක්ෂා කෙළේ ය.
>
> (ලූක් 4:1-2)

මිනිසත් බව ගත් ජේසුස් වහන්සේ තම දූත කාර්ය ආරම්භයේ දී යක්ෂ පරීක්ෂා තුනකට මුහුණදුන් සේක:

| | ජේසුස් මුහුණදුන් පරීක්ෂාව | ජේසුස් වහන්සේගේ පිළිතුර | ලැබෙන පණිවිඩය |
|---|---|---|---|
| I පරීක්ෂාව (ලූක් 4:3-4) | "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම්, මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කළ මැනව." | "මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේ ය" | තමන් සතු බලය හා හැකියා ආත්මාර්ථකාමී ව නොව සමාජ යහපත සඳහා යෙදවිය යුතු ය. ආහාරයෙන් ජීවත් වන ශාරීරික ජීවිතයට වඩා දේව වචනයෙන් පෝෂණය වන ආධ්‍යාත්මික ජීවිතය වැදගත් ය. |
| II පරීක්ෂාව (ලූක් 4:7-8) | "ඔබ මා (යක්ෂයා) ඉදිරියෙහි නමස්කාර කරන්නෙහි නම් ඒ සියල්ල (ලෝකයේ සියලු රට රාජ්‍යයන්) ඔබ සන්තක වන්නේ ය" | "නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේට නමස්කාර කරන්න. උන් වහන්සේට පමණක් සේවය කරන්න." | අප ජීවිතය තුළ දෙවිඳුන්ට හිමි තැන ධනයටවත් බලයටවත් ලබා නොදිය යුතු ය. |
| III පරීක්ෂාව (ලූක් 4:9-12) | "දේව මාලිගාවේ කොත මුදුනේ සිටුවා, "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතනින් පහතට පනින්න. ඔබට රැකවරණය සලසනු වස් දෙවියන් වහන්සේ සිය දූතයන්ට අණ දෙනු ඇත." | "නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරන්න කියා ලියා ඇත." | කීර්තිය පතා කටයුතු නොකළ යුතු ය. |

මෙම පරීක්ෂා ජයගෙන තමන් ඇති දැඩි වූ නාසරෙත් නුවර ධර්මශාලවට සිරිත් පරිදි සබත් දින වැඩම කර උන්වහන්සේ යෙසායා දිවැසිවරයාගේ ග්‍රන්ථය පෙරළා තම දූත කාර්ය පිළිබඳ ව සඳහන් ව තිබූ පාඨය කියවූ සේක.

> සමිඳාණන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසා ද දිළිඳුන් හට සුබ ආරංචිය දේශනා කරනු වස් උන් වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම ද අන්ධයන්ට පෙනීම ද ලැබෙන බව දන්වන්නටත්, පීඩිත වූවත් මුදන්නටත්, සමිඳාණන් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්නටත් මා එවා වදාළ සේක.
>
> (ලූක් 4:18-19)

ඉහත ශුද්ධ ලියවිලි පාඨයේ දැක්වෙන පරිදි උන්වහන්සේගේ දූත කාර්යයේ අරමුණ වන්නේ දිළිඳු, වහල්, පීඩිත හා අන්ධ සැමට සුබසෙත උදාකර දීම යි. එය දේව රාජ්‍යය උදා වී සියලු ජනයා වෙත ගැලවීම ළඟා වීමේ සත්‍යතාව ප්‍රබලව පෙන්වා දෙන්නේ ය.

## ප්‍රාතිහාර්ය

ශුද්ධ වූ අගුස්තීනු තුමාට අනුව ප්‍රාතිහාර්යයක් යනු ස්වභාව ධර්මය තුළ අප දන්නා සත්‍යතාවන්ට පටහැනි ව සිදු වන ක්‍රියාවකි. උදාහරණයක් ලෙස, ස්වභාව ධර්මය තුළ ජලය මිදි යුසට හැරීමක් සිදු නොවේ. එහෙත් ජේසුස් වහන්සේ ජලය මිදි යුසට හැර වූ සේක. නපුරාගේ බලය දුරු කරමින් දේව රාජ්‍යය උදා වූ බව සනාථ කිරීමට ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්ය සිදු කළ සේක. ඒවා වර්ග හතරකට බෙදිය හැකි ය:

1. රෝගීන් සුව කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්ය (HEALINGS)
   අතක් පණ නැති මිනිසා (මතෙව් 12:9-14)
2. දුෂ්ටාත්ම දුරු කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්ය (EXORCISMS)
   ගෙරසීන් රටේ මිනිසා (මාක් 5:1-20)
3. ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය (NATURE MIRACLES)
   මුහුද මත ඇවිදීම (මතෙව් 14:22-31)
4. මළවුන් නැගිටුවීම හා සම්බන්ධ ප්‍රාතිහාර්ය (RAISING THE DEAD)
   ලාසරස් මළවුන්ගෙන් නැගිටු වීම (ජොහන් 11:38-44)




10.2 රූපය - ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රතිහාර්ය වර්ග හතරට නිදසුන්

**ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය තුළින්**

- දෙවියන් වහන්සේ මිනිසාට දක්වන අසීමිත ප්‍රේමය ප්‍රකාශ වේ
- දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට අනාවරණය වේ
- දේව මහිමය හා දේව බලය ප්‍රකාශ වේ
- ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බවට සහතික වේ
- ජේසුස් වහන්සේගේ මෙසියාන ධර්මදූත මෙහෙවර සහතික කෙරේ
- මෙසියානික රාජ්‍යයේ ලකුණු දිස්වේ.

දේව රාජ්‍ය උදාවූ බව ප්‍රාතිහාර්ය මගින් සනාථ කළ ජේසු සමිඳාණෝ එයට වචනයෙන් ද සාක්ෂි දැරූ ආකාරය පහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨය තුළින් ප්‍රකාශ වේ.

> මම දෙවියන් වහන්සේගේ අනුහසින් දුෂ්ටාත්මයාණන් දුරු කරම් නම්, සැබැවින් ම දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ කෙරෙහි උදාවී ඇත.
>
> (ලූක් 11:20)

ප්‍රාතිහාර්යයන් සිදුවීමට ඇදහිල්ල ප්‍රබල බලපෑමක් ඇති කරයි. ශුභාරංචි ග්‍රන්ථ තුළ ප්‍රාතිහාර්යයන් ඇදහිල්ලේ වතාවරණයන් තුළ සිදුවන ආකාරය දිස්වේ.

1. ජේසුස් වහන්සේ ජෙරිකෝවේ අන්ධයාට මෙසේ වදාළ සේක:

   "පෙනීම ලබන්න, ඔබේ ශ්‍රද්ධාව ඔබ සුව කළේ ය" (ලූක් 18:42)

2. සළුවට අත ගැසූ ස්ත්‍රියට ජේසුස් වහන්සේ මෙසේ වදාළ සේක:

   "දියණියෙනි, ධෛර්ය ගන්න, ඔබේ ඇදහිල්ල ඔබ සුවපත් කළේ ය." (මතෙව් 9:22)

සියලු ගැටලු හා අභියෝගවල දී උන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත්වීම තුළ ප්‍රාතිහාර්ය අත්දැකිය හැකි ය. එම අත්දැකීම ප්‍රබල වන තරමට අපගේ ඇදහිල්ල ද ප්‍රබල වේ.

**හැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය (ලූක් 10:1-12)**

ශ්‍රාවකයන් හැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය පිළිබඳ ව සඳහන් කරන්නේ ශුද්ධ වූ ලූක් තුමා පමණි. ශුද්ධ ලියවිලි විශාරදයින්ගේ මතය වන්නේ එකල ලෝකයේ ජාතීන් හැත්තෑවක් විසූ බව ය. ශුභාරංචිය නොදන්නා සියලු ජනතාවට ශුභාරංචි පණිවිඩය රැගෙන යාම 70 දෙනාගේ ධර්මදූත මෙහෙය සංකේතවත් කරයි.

ජේසුස් වහන්සේ දේව රාජ්‍ය මිනිස් හදවත් තුළ ස්ථාපිත කිරීමේ කාර්යයට දයක කර ගැනීමට පිරිසක් තෝරා ගත් සේක. ඔවුන්ට එම ධර්මදූත සේවාවේ අවශ්‍යතාවත් එම සේවාවේ දී මුහුණදීමට සිදුවන අභියෝගයත් පැහැදිලි කර දුන් සේක. දිව්‍ය සංරක්ෂණය අත්දැකීම සඳහා පසුම්බියක් හෝ මල්ලක් හෝ පාවහන් හෝ රැගෙන නොයෙන ලෙස අවවාද කර පිටත් කර යවන සේක:

ගොයම නම් බහුල ය. ගොවීහු විරල ය. එබැවින් ගොයම් කැපීමට මෙහෙකරුවන් එවන මෙන් ගොයමේ හිමියාණන්ට යාච්ඤා කරන්න. ඉතින් යන්න. වගවලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන් මම ඔබ යවමි. පසුම්බියක් හෝ මල්ලක් හෝ පාවහන් හෝ නොගෙන යන්න. යම් ගෙදරකට ඇතුළු වූ කල පළමු කොට "මේ ගෙදරට සාමය වේවා!"යි පතන්න. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ වෙත පැමිණියේ යැයි ඔවුන්ට ප්‍රකාශ කරන්න.

(ලූක් 10:1-9)

ලෝකාවසානය දක්වා ම දේව රාජ්‍ය පතළ කිරීමේ කාර්ය ශුද්ධ වූ සභා මාතාවට පැවරී ඇත. ශුද්ධ වූ සභා මාතාවගේ දරුවන් වන අපට ද එම වගකීම බෞතීස්මය මගින් භාර වේ. එම වගකීම නම්, කිතුනු වටිනාකම් ඔබ තුළ තහවුරු කර ගැනීමත් එම වටිනාකම් සමාජයට ගෙන යාමත් ය.

එපමණක් නොව ධර්මදානය හා ධර්මෝපදේශය මගින් ධර්මය ගැන කතා කිරීම, කියා දීම හා ජීවත්වීම මගින් ලොවට ශුභාරංචිය ගෙන යා හැකි ය. ඒ සඳහා හොඳ ම තෝතැන්න වන්නේ මීසම තුළ ඇති ගිහි අපෝස්තලික සේවා ය. ඒවාට සම්බන්ධ වී ශුභාරංචිය පතළ කිරීම අප සැමගේ වගකීමකි. එය ක්‍රිස්තුන් වහන්සේගේ දූත සේවාව ඉදිරියට ගෙන යාමකි.

**ක්‍රියාකාරකම**

1. ඇදහිල්ල තුළ ජීවත්වීම නිසා ඔබ ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ අත්දුටු අවස්ථාවක් ලියා දක්වන්න.
2. කිතුනු සිසුවකු වන ඔබ සකල ජාතීන්ට ශුභාරංචිය රැගෙන යාමේ වගකීම ඉටු කරන ආකාරය කරුණු **පහකින්** ලියා දක්වන්න.
3. අප ජීවිත තුළ ප්‍රාතිහාර්ය සිදු වීමට අප විසින් කළ යුතු කාර්යයන් **තුනක්** ලියන්න.
4. මෑත කාලයේ ඔබ අත්දුටු ප්‍රාතිහාර්යක් ලියා දක්වන්න.



**ජීවිතයට බිඳක්**

★ *ඇදහිල්ල තුළ ජීවමාන සමිඳුන් අත්දකිමු.*

★ *ධර්මදූත සේවාව අපගේ වගකීමකි.*

★ *ජේසුස් වහන්සේ මෙන් අප ද දුබලයන් වෙත දයාව දක්වමු.*